**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**

**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ..............................................................................
   (මුල'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ..............................................................................
3. පාසල් වර්ගය (200 තෙක්/ 201 - 500 තෙක්/ 500 ට වැඩි) ..............................
4. කලාපය : ..............................
5. පළාත : ..............................

**11 ශ්‍රේණිය** | **පද්‍ය නිර්මාණ හා අවබෝධය** | **කාලය පැය 02**

- පළමුවන කොටසට අයත් **සියලු ම ප්‍රශ්නවලට** පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ (අ), (ආ) ප්‍රශ්න දෙකෙන් **එක් ප්‍රශ්නයකට පමණක්** පිළිතුරු සපයන්න.
- ඔබගේ පිළිතුරු පත්‍රය සමග ප්‍රශ්න පත්‍රය ද අමුණා එවිය යුතු ය.

## I කොටස

(01) (අ) සාහිත්‍යකරණයට රජුන්ගේ දායකත්වය ලැබීම ලංකා ඉතිහාසයේ මුල් අවධියේ සිට සොළොස්වන සියවස දක්වා කැපී පෙනෙන ලක්ෂණයකි. අනුරාධපුර යුගයේ විසූ පස්වන කාශ්‍යප හා සිවුවන සේන, දඹදෙණි යුගයේ විසූ දෙවන පරාක්‍රමබාහු සහ කෝට්ටේ යුගයේ විසූ සවන පරාක්‍රමබාහු යන රජවරු ග්‍රන්ථ කර්තෘවරු වෙති. වංසකතාවලට අනුව දෙවන මුගලන් රජු මහා සාහිත්‍යධරයෙකි. බුද්ධදාස, සිවුවන පරාක්‍රමබාහු යන රජවරු ද, ලීලාවතී රැජින ද, දෙවන පරාක්‍රමබාහු රජ සමයෙහි විසූ දේව ප්‍රතිරාජ නම් අමාත්‍යවරයා ද, නන්නූරුතුනෙයාර් අමාත්‍යවරයා ද, උලකුඩය දේවිය ද සාහිත්‍යකරණයට අනුග්‍රහය දැක් වූ අය ලෙස දැක්වෙති. පොත් පිටපත් කිරීම සඳහා විශේෂ නිලධාරීන් කොටසක් පත්කර ඔවුන්ට වැටුප් ගෙවන ලද බවට ද සාධක හමුවේ.

i. සාහිත්‍ය ඉතිහාසයේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ කුමක් ද?

ii. දඹදෙණි යුගයේ විසූ රජ කෙනෙකුගේ නමක් ලියන්න.

iii. වංසකතාවලට අනුව මහා සාහිත්‍යධර රජු කවුරුන් ද?

iv. දෙවන පරාක්‍රමබාහු රජ සමයේ සාහිත්‍යකරණයට දායක වූ දෙදෙනෙකු නම් කරන්න.

v. විශේෂ නිලධාරීන් පිරිසක් පත් කළේ කුමකට ද? **(ලකුණු 1 X 5 = 5)**

(ආ) කුමාරතුංග මුනිදාස මහතා සිංහල භාෂා සාහිත්‍ය කටයුතුවලට සම්බන්ධ වන විට සමකාලීනව කැපී පෙනුණු ගිහි විද්වතා වූයේ වාසල මුදලි ඩබ්ලිව්. එෆ්. ගුණවර්ධන මහතා ය. ද්විභාෂික උගතකු වූ ඔහු විසිවන සියවසේ මුල් තුන් දශකය තුළ ගෙන ගිය ශාස්ත්‍රීය කටයුතු නිසා සමකාලීන විද්වතුන්ගේ අවධානය ඔහු කරා ඇදී ආයේ ය. සිදත් සඟරාවේ මුල් අදියර දෙක සඳහා ව්‍යාඛ්‍යානයක්, වශයෙන් 1924 දී ඔහු විසින් 'සිද්ධාන්ත පරීක්ෂණය' නමින් පළ කරන ලද කෘතිය සිංහල ව්‍යාකරණය සම්බන්ධයෙන් එතෙක් පැවති අශාස්ත්‍රීය මතවාද විවේචනය කරන්නක් විය. එමෙන් ම සිංහල භාෂාව සඳහා 'විද්‍යාත්මක මූල ධර්ම මත ලියැවුණු සවිස්තර සිංහල ව්‍යාකරණයක' අවශ්‍යතාවත්, ඒ සඳහා මඟ හෙළි කිරීමට සිදත් සඟරාව බඳු කෘතියක සැබෑ ස්වරූපය ප්‍රචාරයට පත් කිරීමේ අවශ්‍යතාවත් සැබෑ ලෙස ම පැවතුණි.

i. කුමාරතුංග මුනිදාස මහතා මෙහි සම්බන්ධ වූ ක්ෂේත්‍රය කුමක් ද?
ii. වාසල මුදලි ඩබ්ලිව්. එෆ්. ගුණවර්ධන මහතා වෙත සම කාලින විද්වතුන්ගේ අවධානය යොමු වූයේ ඇයි?
iii. සිද්ධාන්ත පරීක්ෂණය නම් කෘතියේ සඳහන් වී ඇත්තේ මොනවා ද?
iv. එම කෘතිය පළ කරන ලද වසර සඳහන් කරන්න.
v. සවිස්තර සිංහල ව්‍යාකරණයක අවශ්‍යතාවට මග හෙළි කළේ කිනම් කෘතිය ද?

(ලකුණු 1 X 5 = 5)

(02) පද පූරණය කොට ලියන්න.

i. ගොවි ගෙවි ලියන්නේ
......................................................................
රටට බත සදන්නේ
......................................................................

ii. ......................................................................
......................................................................
බෝපත් සිලි සිලිය රැව් පිළිරැව් දෙනවා
පන්සල් බිම සිල් සුවඳින් ඉතිරෙනවා

iii. ලොවේ අනෙක් රටවල් දෙස දෙනෙත් යොමන විට
අසීමිතව සම්පත් ඇත මගෙ මව් රටට
......................................................................
......................................................................

iv. ඇවිලෙයි ගින්දරක් හදවත පතුලෙන්ම
......................................................................
කඳුලක් නැගෙයි සිහිවෙන විට නිතැනින්ම
......................................................................

v. කඳු ගැටයකින් පැන ආ දිය උල්පතකි
පහළින් නො නැවතී ගලනා ගං දියකි
......................................................................
......................................................................

(ලකුණු 2 X 5 = 10)

(03) පහත කවි පැනවලට අදාළ විරිතින් ම පිළිතුරු ලියන්න.

i. කොතරම් බණ කීවත් අපෙ ලංකාවේ
නැ අඩු වන්නෙ වංචා නම් තව බෝවේ
දැන් මොනව ද කළ යුත්තේ නැහැ කීවේ
අප හට පවසන්න දරුවනි, දුක වැඩිවේ

ii. සියොතුන් ඉගිළ යයි
දිය වැල් ගලා යයි
මිහිලිය සිනාසෙයි
එත් තව දුක ඇයි?

iii. සැන්දෑ යාමයේ ඉර බැසලා යන්නේ
වැඩ නිම වී අම්මා ගෙදරට එන්නේ
හනිකට ගෙදර වැඩ ඇයගෙන් සිදු වන්නේ
කළ හැකි උදව් මොනවද මට පවසන්නේ?

iv. අලුත් තාලෙට හිතන කන බොන
අඳින පළඳින තරුණ පරපුර
සාහිතය ගැන වැඩිය ඇල්මක්
නොදක්වන්නේ ඇයි ද සොහොයුර?

v. නොමිනිස් කැළක් වෙසෙනා මේ මිනිස් රැසේ
ඇයි දරුවන් අසරණ වන්නේ මෙලෙසේ?
ජීවත් වෙන්න වෙර දරනා උන් දුක සේ
ගෙනෙමු ද? නීතියක් බිය සැක නැතුව තොසේ (ලකුණු 2 X 5 = 10)

(04) (අ) පහත දැක්වෙන පද්‍ය පාදයන් හි ඇති මාත්‍රා සංඛ්‍යාව ගණන් කර ඒ ඉදිරියෙන් ලියන්න.

i. මගේ මව් පියෝ වාසනාවක්

..........................................................................................

ii. ඉමක් කොනක් නොපෙනෙන මේ භව ගමන

..........................................................................................

iii. අකුරු මැකි නෑ කොළ ගැලවී නෑ

..........................................................................................

iv. රන් මලක් ලෙස දෙව් බඹුන් දෝතින් පිදූ මේ පිං බිමේ

..........................................................................................

v. මා ඉපදුන පින්බර ලංකා මාතා

..........................................................................................

vi. 'අ' යන්න කියන්න ලොවටම ඇහෙන්න

.......................................................................................... (ලකුණු 1 X 6 = 6)

(ආ) පහත දැක්වෙන රූපක උපමා බවට පත්කර ලියන්න.

i. අම්මා සඳකි

.............................................................................

ii. සඳ රන් තැටියකි

.............................................................................

iii. නිදහස මහ මුහුදක් වේ.

.............................................................................

iv. සුර ගඟ අඟන

............................................................................. (ලකුණු 1 X 4 = 4)

(05) පහත දැක්වෙන චිත්‍රය මැනවින් නිරීක්ෂණය කොට ඔබේ සිතේ හටගන්නා කාව්‍යමය සංකල්ප පද්‍ය දහයකින් පමණ ඉදිරිපත් කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න. (සඳැස් නම් කවි 6 - 8 ක් අතර විය යුතු ය. නිසඳැස් නම් පේළි 25 - 30 ත් අතර විය යුතුය.)



(ලකුණු 10)

## II කොටස

(01)
- (අ) කොටසින් හෝ (ආ) කොටසින් **කැමති ප්‍රශ්නයක් තෝරා** ගෙන කාව්‍ය නිර්මාණයක් කරන්න.
- සඳැස් පද්‍ය පන්තියක් නම් කවි 6 - 8 ක් විය යුතු ය.
- නිසඳැස් පද්‍ය පන්තියක් නම් පේළි 25 - 30ක් අතර විය යුතු ය.

### (අ) කොටස

(අ) i.

දසතින් නැගෙයි කන් පුපුරන වෙඩි සද්ද
ඇවිදින් වගෙයි රටට ම නව අවුරුද්ද
සුවඳින් පිරෙයි කැවුමයි කොකිසයි බැද්ද
සතුටින් ගෙවෙයි සැමදා මගෙ අවුරුද්ද

(මාතෘකාව - අවුරුදු සිරි)

ii.

සිගිති මුවින් සිනහව වැගිරෙන්නේ
රෝස මලක මුදු සුවඳ ගෙනෙන්නේ
පුංචි නංගි මට මැණිකක් වැන්නේ
මගෙ පණ වැනි සුදු නංගි රකින්නේ

(මාතෘකාව - මගෙ සුදු නංගි)

(ලකුණු 50)

### (ආ) කොටස

(ආ) i. ජංගම දුරකථනය භාවිත කිරීමේදී සිදුවිය හැකි හානි පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීමට සුදුසු කවි පන්තියක් ලියන්න.

ii. 'මගේ රට මට අගෙයි' යන මැයෙන් පාසල් සමිතියේ දී ඉදිරිපත් කිරීමට විරිඳු පෙළක් නිර්මාණය කරන්න.

(ලකුණු 50)